කින්නියා ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 03 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 13 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කින්නියා ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

සභාව විසින් මුදල් හා උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. එනමුත්, වර්ගීකරණය පිළිබඳ යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සේවක ණය ලේඛනය අනුව රු.1,765,429 ක්වූ සේවක ණය මූල්‍ය ප්‍රකාශනවල රු.1,785,489 ක් ලෙස දැක්වීම නිසා සේවක ණය රු.20,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ඇප තැන්පතු ලේඛනය අනුව රු.547,364 ක්වූ ඇපතැන්පතු මූල්‍ය ප්‍රකාශනවල රු.180,000 ක් ලෙස දැක්වීම නිසා ඇප තැන්පතු රු.367,364 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) රු.1,723,507 ක්වූ පුරනැගුම ව්‍යාපෘතියේ රැඳවුම් මුදල් තැන්පතු ගිණුමේ පෙන්වනු වෙනුවට වෙනත් ආදායම් වශයෙන් පෙන්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සභා ආදායම සමාන මුදලකින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 ගෙවිය යුතු මුදල්
-------------------

රු.2,159,544 ක් විශ්‍රාම දායක මුදල්, නිරවුල් කිරීමෙන් තොරව වසර 09 ක් තිස්සේ දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම

රු.4,797,899 ක ප්‍රමාණයක් වූ, යන්ත්‍රාගාර සහ යන්ත්‍ර මෝටර් වාහන සහ ලී බඩු සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. ඒ අතර, ගෙවූ අත්තිකාරම් සඳහා කාලවිශ්ලේෂණයන්ද ඉදිරිපත් කර නොතිබුණි. එනිසා ඒවා විගණනයේදී සත්තේක්ෂණය කළ නොහැකි විය.

### 1.3.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනත 173 වගන්තිය | සභාව විසින් සපයනු ලබන සේවා සඳහා ගිවිසුම්වලට එළඹිය යුතු වේ. එනමුත් 2016 හා 2017 වර්ෂවලදී සභාව විසින් කුලියට දෙනුලැබූ ගවමස් සහ මාළු කඩ කාමර 09 ක් සම්බන්ධයෙන් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. |
| (ආ) | මෝටර් ප්‍රවාහන පනත 203 වගන්තිය | වාහන සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගත යුතු වේ. එනමුත් 2015 සිට 2017 වසරවල් තුළ වාහන 08 ක් සඳහා එවැනි බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.7.7 | සභාවේ ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන්ට ප්‍රසම්පාදන පරිපාටිය පිළිබඳ දැනුමක් තිබිය යුතු වේ. එනමුත් එම අවශ්‍යතාවය නොසලකා, ප්‍රජා සේවා නිලධාරියෙකු සමාජිකයෙකු වශයෙන් පත්කර තිබුණි. |
| (ඈ) | 2006 ප්‍රසම්පාදන අත්පොත් අංක 3.4.2 වගන්තිය අ(1) | මිල ගණන් කැඳවීමේදී අවශ්‍ය ප්‍රමාණය සඳහන් කළ යුතුය. එනමුත් සභාව තම මිල කැඳවීම්වල "ඒකකය" යන යෙදුම භාවිතා කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලබාගත හැකිව තිබූ කොමිස් මුදල් නොලැබී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,707,743 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,015,331 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,692,100 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.2 **ආදායම් පරිපාලනය**

-----------------------

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

---------------------------------------------------------------------------

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2017** | | | | **2016** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| කුලී | 4,875 | 3,087 | 3,087 | 1,787 | 5,100 | 466 | 466 | 4,633 |
| බලපත්‍ර ගාස්තු | 3,210 | 1,303 | 1,303 | 906 | 950 | 2,186 | 2,186 | |

2.2.2 වරිපනම් හා බදු

------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ134(1) වගන්තිය ප්‍රකාරව සභා ප්‍රදේශය තුළ වූ නිශ්චල දේපළ හඳුනාගෙන වටිනාකම් තක්සේරු කර, ඒ අනුව වරිපනම් හා බදු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.2.3 ගව මස්කඩ බදු දීම

---------------------

කඩකරුවන් විසින් ගෙවීම් පැහැර හැරි අවස්ථාවලදී ඔවුන්ගේ තැන්පතුවලින් හිඟ ගව මස්කඩ කුලි අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. එනිසා රු.6,444,365 ක සමුච්චිත හිඟ මුදලක් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරිණි. මෙම හිඟ මුදල් පිළිබඳ කාල විශ්ලේෂණයක් සභාව විසින් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. එනිසා විගණනයේදී ශේෂ තහවුරු කළ නොහැකි විය.

2.2.4 කුලි ආදායම්

--------------

කච්චාකොඩිතිවු පොදු වෙළඳපොළ බදුදීම

-------------------------------------------

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ සිදු කළ ප්‍රතිපාදන යටතේ 2014 වර්ෂයේදී රු.21,510,853 ක පිරිවැයකින් වෙළඳ සංකීර්ණය ඉදිකර තිබුණි. වෙළඳ සංකීර්ණ පරිශ්‍රයෙන් පිටත වූ කඩ කාමර 32 කට අතිරේකව සංකීර්ණයේ කඩ කාමර 36 ක් පැවතිණි. ඇතුළත වූ කඩ කාමරයකට රු.30,000 බැගින් සහ බාහිර කඩ කාමරයකට රු.20,000 බැගින් රු.1,720,000 ක් සභාවට ලැබිය යුතුව තිබුණි. මේ දක්වා රු.450,000 ක් පමණක් සභාව අයකර තිබුණි.

2.2.5 මුද්දර ගාස්තු

-------------

2016 සැප්තැම්බර් සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කාලපරිච්ඡේදය සඳහා වූ මුද්දර ගාස්තු ගණනය කර අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

2.2.6 විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු අය කිරීම

සභා ප්‍රදේශය තුළ ස්ථාපනය කර තිබූ විදුලි සංදේශන කුළුණු 05 කින් ලැබිය යුතු ගාස්තු නිශ්චය කර ඒ අනුව අයකිරීම් සිදු කිරීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන යටතේ 2011 සිට 2017 කාලපරිච්ඡේදය තුළදී රු.15,865,932 ක පිරිවැයකින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. එනමුත් මෙම ප්‍රදේශයේ වෙන්කිරීමකින් තොරව දිගින් දිගට කසළ බැහැර කෙරේ. කොම්පෝස්ට් පොහොර යන්ත්‍රාගාරයෙන් සභාවට නොතිබිණි.

(ආ) පාරිසරික ගැටළු

1988 අංක 56 සහ 2000 අංක 53 පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ ප්‍රසිද්ධ කළ 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 ගැසට් පත්‍රය ප්‍රකාරව ප්‍රදේශයේ ඝාතකාගාර සඳහා මධ්‍යම පාරිසරික අධිකාරිය වෙතින් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. ඝාතනය කරන ලද සත්වයන්ගේ ඉතිරි කොටස් අසළ පිහිටි ගංභාවට වැටීමෙන් පරිසර දූෂණය වෙමින් පැවතිණි.

(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක

එක්සත් ජාතීන්ගේ රටවල ප්‍රධානීන් විසින් 2015 වසරේ පැවති සමුළුවේදී තීරණය කළ 2030 තිරසාර සංවර්ධන ඉලක්ක වැඩසටහන පිළිබඳ සභාව දැනුවත්වී නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2008 සිට 2013 කාලපරිච්ඡේදය සඳහා වූ සභා සේවකයින්ගේ විශ්‍රාම දායක මුදල් ප්‍රේෂණය කිරීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි. රු.548,523 ක මුදලක් වැන්දඹු හා අනත්දරු අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ) පළාත් මූල්‍ය රීති 163.3 ප්‍රකාරව, දින 10 ක් තුළදී අත්තිකාරම් නිරවුල් කළ යුතුය. එනමුත් වසර 07 ක කාලයක් තිස්සේ රු.161,544 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් එවැනි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළදී ලබාදෙන ලද රු.540,412 ක්වූ අත්තිකාරම්ද බේරුම් නොකර පැවතිණි.

(ඇ) එකතුව රු.2,106,258 ක්වූ ගෙවීම් වවුචර් අටක් 2013 වර්ෂයේදී අස්ථානගතව තිබූ අතර, එකතුව රු.3,253,657 ක් වූ ගෙවීම් වවුචර් 44 ක්ද 2014 වර්ෂයේදී අස්ථානගතවී තිබුණි. මූල්‍ය රීති 187.2 ප්‍රකාරව, ගණන්දීමේ නිලධාරී විසින් මෙම තොරතුරු වහාම පළාත් ලේකම්ට පිටපත් සහිතව විගණකාධිපතිට වාර්තා කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩලය විසින් පෙන්වා දුන් ඌනතා සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxix පරිච්ඡේදයේ 4.4 වගන්තියේ නියම කර ඇති පරිදි, ණය බේරුම් කිරීමට ප්‍රථම නිලධාරියෙකු මියගිය විට උරුමකරුවන්ට ලැබිය යුතු මුදල්වලින් ඒවා අඩු කර න ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂගෙන් ඉල්ලා සිටිය යුතුය. එනමුත් සේවකයන් 07 දෙනෙකුගෙන් අයකළ යුතු රු.133,220 ක් සම්බන්ධයෙන් සභාව විසින් එපරිදි කටයුතු කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

-------------------------------

3.4.1 වත්කම් ලියාපදිංචි කිරීම

----------------------------

වසර 2008 සිට 2016 තුළදී වෙනත් අමාත්‍යාංශ සහ ආයතන මඟින් සභාවට පරිත්‍යාග කරන ලද වාහන 05 ක අයිතිය ලබාගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. වර්තමානයේ මෙම වාහන සභාව විසින් භාවිතා කරමින් පවතියි.

3.4.2 අක්‍රීය වත්කම්

---------------

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.1,000,000 ක පිරිවැයකට කොන්ත්‍රාත්කරුවකු විසින් ඉදිකරණු ලැබ, 2016 දෙසැම්බර් 31 දින භාරදෙනු ලැබූ මහජන වැසිකිළියක් භාවිතයෙන් තොරව පැවතිණි.

3.5 අනාර්ථික ගනුදෙනු

---------------------

2011 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාළව සේවකයන් 13 දෙනෙකුගේ රු.462,112 ක්වූ දායක මුදල් සහ 2012 ජනවාරි සිට 2013 අගෝස්තු දක්වා කාලයකට අදාළව සේවකයන් 16 දෙනෙකුගේ රු.748,864 ක්වූ දායක මුදල් සේවක අර්ථසාධක අරමුදලට නියමිත දිනවල ප්‍රේෂණය කර නොතිබීම නිසා රු.540,770 ක්වූ අධිභාර සභාව විසින් ගෙවා තිබුණි.

3.6 ප්‍රසම්පාදන පටිපාටි

--------------------

3.6.1 ප්‍රසම්පාදන සැලසුම්

----------------------

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2006 මාර්තු 24 දිනැති අංක 128 චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය
--------------------------

3.6.2.1 සංචාරක අමුත්තන්ගේ නිවාසය යළි ඉදිකිරීම
----------------------------------------------

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සභා සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ 2017 ඔක්තෝබර් 10 දින රු.1,999,875 ක මුදලකට නාඩුතිව් සංචාරක අමුත්තන්ගේ නිවාසය යළි ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව නාඩුතිව් ප්‍රජා මධ්‍යස්ථානයට පිරිනමා තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරන ලදී.

(අ) විගණනය සිදු කළ 2018 මාර්තු 23 දින වන තුරුත්රු.191,762 ක් සඳහා වූ වැඩ නිමකර නොතිබුණු නමුත්, වැඩ සතුටුදායක අන්දමින් නිමකර ඇති බවට වැඩභාර නිලධාරියා විසින් සහතික කර තිබුණි.

(ආ) ගිවිසුමට අනුව මෙම කර්මාන්තය 2017 දෙසැම්බර් 15 දිනට පෙර නිමකර සභාවට භාරදිය යුතුව තිබුණි. එනමුත් විගණනය සිදුකළ 2018 මාර්තු 23 දක්වාත් කර්මාන්තය නිමකර නොතිබුණි. රු.49,000 ක් වූ ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. සියලුම වැඩ 2017 දෙසැම්බර් 15 දින නිමකර ඇති බව සඳහන් කරමින් ව්‍යාජ ලියවිලි ඉදිරිපත් කර තිබුණි.

3.6.2.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම
-------------------------------------------------------

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන යටතේ මධ්‍යස්ථානය වටා කටුකම්බි වැටක් ඉදිකිරීම සහ විදුලි ලාම්පු සවිකිරීම සඳහා 2017 සැප්තැම්බර් 07 දින රු.11,406,212 ක මුදලකට සභාව ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරිණි.

(අ) ගොඩනැගිල්ල වටා වැට
-------------------------

i. පරිමාන 10 න් සමන්විත මි.මි 3.2 මිනුමේ මී $750^2$ කටු කම්බි මධ්‍යස්ථාන වැට සඳහා භාවිතා කළ යුතුවිය. එනමුත් පරිමාන 10 න් සමන්විත මි.මි 3 මිනුමේ රු.397,800 ක වටිනා කම්බි භාවිතා කර තිබුණි.

ii. මි.$12^3$ මිනුමේ පනා බැම්මක් ඉදිකිරීම සඳහා රු.144,000 ක මුදලක් ගෙවා තිබුණි. මි $1.12^3$ මිනුමේ පනා බැම්මක් ඉදිකිරීම හේතුකොට ගෙන රු.135,500 ක වැඩිපුර ගෙවීමක් සිදුව ඇති බැව්, භෞතික පරීක්ෂණයේදී හෙළිවිය.

(ආ) විදුලි ලාම්පු සවිකිරීම
----------------------

i. විදුලි ලාම්පු සවිකිරීම සඳහා කොන්ක්‍රීට් කණු භාවිතා කිරීම සඳහා රු.150,000 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණි. එනමුත් කොන්ක්‍රීට් කණු භාවිතා කර නොතිබුණි. ඒ වෙනුවට ජීඅයි පයිප්ප භාවිතා කර තිබුණි.

ii. විදුලි සම්බන්ධතාවය ලබාගැනීම සඳහා රු.200,000 ක මුදලක් ගෙවා තිබුණි. එනමුත් 2018 ජුනි 6 දින දක්වාම එය ලබාගෙන නොතිබුණි.

3.6.2.3 කච්චකොඩිතිව් මාළු වෙළඳපොළ ඉදිකිරීම

---------------------------------------------

කච්චකොඩිතිව් මාළු වෙළඳපොළ ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව රු.999,737 ක මුදලකට 2017 ඔක්තෝබර් 17 දින ප්‍රජා මධ්‍යස්ථානයකට පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්‍ෂණයන් සිදු කෙරේ.

(අ) විගණන සෝදිසි පරීක්‍ෂණවලට අනුව කිරිගරුඩ ගල් ඇතිරීම, සුද තැබීම, පින්තාරු කිරීම සහ අනෙකුත් සම්බන්ධිත කාර්යයන් වෙනුවෙන් රු.243,906 ක මුදලක් ගෙවිය යුතුව තිබුණි. එනමුත් රු.371,152 ක ගෙවීමක් සභාව විසින් තහවුරු කොට එය පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට යොමුකර තිබුණි. වැඩියෙන් ගෙවීම රු.127,249 ක් විය.

(ආ) මෙම ගොඩනැගිල්ල සඳහා ජලය හා විදුලිය සපයා නොතිබු බැවින්, ගොඩනැගිල්ල අක්‍රීයව පැවතුණි.

3.6.2.4 ප්‍රජා මධ්‍යස්ථානවලට භාර කළ කොන්ත්‍රාත්තු

-------------------------------------------------

මුදල් කොමිසමේ 2013 ජුලි 26 දිනැති අංක එෆ්ඕ/3/3/2013 චක්‍රලේඛයට අනුව රු.2,000,000 ඉක්මවන කොන්ත්‍රාත්තු ප්‍රජා මුල සංවිධානවලට පිරිනැමිය නොහැක. එනමුත් චක්‍රලේඛ උපදෙස් පැහැර හරිමින්, රු.2,198,862 කොන්ත්‍රාතු 4 ක් රු.3,199,306 ක කොන්ත්‍රාත්තු 3 ක් සහ රු.3,099,737 ක කොන්ත්‍රාත්තු 3 ක් පිළිවෙලින් අල් මදිනා, නාඩුතිව් සහ අල්බෘනි ප්‍රජා මධ්‍යස්ථානවලට පිරිනමා තිබුණි.

4. වගකීම්භාරය සහ යහපාලනය

-------------------------------

අයවැය පාලනය

-----------------

ඇස්තමේන්තුගත සහ තත්‍ය වියදම් අතර සියයට 7 සිට 93 දක්වා වූ පරාසවල විචලතා පෙන්නුම් කෙරුණ හෙයින් අයවැය කාර්යක්‍ෂම කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කර ගෙන නොතිබුණි.

5. පද්ධති සහ පාලන

--------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

| | පද්ධති හා පාලන | අවධානය අවශ්‍ය කරුණු |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | i. ලෙජරය යාවත්කාලීනව පැවැත්වීම<br>ii. වියදම් අනුව වත්කම් වර්ගීකරණය |
| (ආ) | ආදායම් පරිපාලනය | හිඟ ආදායම් රැස්කිරීම සඳහා කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | i. කොන්ත්‍රාත්තු පිරිනැමීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීම<br>ii. ප්‍රජා මධ්‍යස්ථානවලට කොන්ත්‍රාත් පිරිනැමීමේදී මුදල් කොමිසමේ චක්‍රලේඛ උපදෙස් අනුගමනය කිරීම. |